# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2108/31 - 2019 ජනවාරි මස 29 වැනි අඟහරුවාදා - 2019.01.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ව/18/04/2013.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/4/2013/ඩී/535.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, නවම්මහර ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්. 4123 හා 2018-12-31 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5495 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි :

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : කජුගහකුඹුර; විස්තරය : විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: අංක 18/3, සන්සිටි මහල් නිවස, ශාන්ත අන්තෝනි මාවත, කොළඹ 03 පදිංචි ජනක අඹගහවත්ත; මුල් හිමිකම් කියන අය : - ; ප්‍රමාණය : හෙක්ටයාර 0.0610.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම : කජුගහකුඹුර; විස්තරය : ඇළ; හිමිකම් කියන අය: අංක 18/3, සන්සිටි මහල් නිවස, ශාන්ත අන්තෝනි මාවත, කොළඹ 03 පදිංචි ජනක අඹගහවත්ත; මුල් හිමිකම් කියන අය : - ; ප්‍රමාණය : හෙක්ටයාර 0.4885.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 අප්‍රේල් මස 24 වැනි දින පූ.භා. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019 අප්‍රේල් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

පී. ඩී. ටී. සී. රාජිකා,  
ප්‍රාදේශීය ලේකම්,  
වත්තල.

2019 ජනවාරි මස 26 වැනි දින,  
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-474